

වනයේ චාරිකාව
මිතුලි රත්නායක

වනයේ චාරිකාව

මිතුලි රත්නායක

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

5 ශ්‍රේණිය C

පළමු ප්‍රකාශනය

ISBN – 978-624-208-790-0

# පිදුම

මාගේ අම්මට අප්පච්චිට,

අක්කලා දෙන්නටම,

අත්තම්මට අත්තට,

සියලුම ගුරු මෑණිවරුන්ටත් පියවරුන්ටත්,

මම මේ පොත පුදමි

පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණ ගත්කරණී** "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලාතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර

මගේ ගෙදර තියෙන්නේ ලස්සන පරිසරයක ගෙදර ඉදිරිපසින් ගලා බසින ගඟ නිසා සුන්දරත්වය තවත් වැඩි වෙනවා.



ගඟින් එගොඩ මල් පලතුරු වලින් පිරුණු ගස් ඇති වනාන්තරයක් තිබුණා. වනාන්තරයේ සිටින සතුන් කුරුල්ලන්ගේ නාදය ගස්වැල්වල සුන්දරත්වය විදිමින් මම මගේ විවේක කාලය ගත



ගඟේ සිටින විවිධ මාළුන් පක්ෂීන් වර්ග ඉබ්බෝ ආදී සතුන් සමග ගං ඉවුරේ මම කාලය ගත කළා

ගඟෙන් එගොඩ වනාන්තරයට යන්නට මට තිබුණේ පුදුම ආසාවක් ගඟේ වතුර වැඩි නිසාත් පාලමක් නැති නිසාත් වනාන්තරයට යෑම සිහිනයක් වුණා.



ගෙදර කවුරුත් නැති වෙලාවක මම ගගෙන් එගොඩ වුණා. වනාන්තරයේ ඇති අඹ පේර ලොවියාදී පලතුරුකමින් ටිකෙන් ටික වනාන්තරයේ ඇතුලටම ගියා



ටික දුරක් යන විට මට අලි පැංචක් හමුවුණා. චූටි බබෝ මේ කොහේද යන්නේ කියලා අලි පැංචා මගෙන් ඇහුවා මම කිව්වා මම මේ වනාන්තරේ ලස්සන බලන්න ආවා කියලා කොහෙද යන්නේ කියලා මම ඇහුවා. එයා කිව්වා මගේ යාළුවා වලස් පැංචා මිබ වෙන්න යනවා කියලා. එහෙමනම් අපි දෙන්නම යමු ගිහින් වළස් පංචා එක්ක වනාන්තරේ ලස්සන බලමු.




ඔහොම යනකොට වලස් පැංචා හමුවුනා අලිපැංචා වළස් පංචාට මං ගැන විස්තර කිව්වා. එයාලට තවත් යාළුවෙක් එකතු වුණා කියලා සතුටු වුණා. අපි කැලේ ඇවිද වෙනකොට කුරුල්ලන්ගේ බීජි නාදය තවත් වැඩි වුනා ඔයා පිළිගන්න වා තමයි ඔය කුරුල්ලෝ සින්දු කියන්නේ.



ගස් දෙකක් අතරේ වැඩී තිබුණ විශාල වැලක එල්ලී මමයි වලස් පැංචයි ඔන්චිලි පැද්දා අලි පැංචා ඔලුවෙන් අපිව තල්ලු කළා. මට දැන් හරි සතුටුයි.



තව ටික දුරක් යනවිට අලි පැංචගේ අම්මයි තාත්තයි හමුවුණා. මගේ යාළුවෝ දෙන්නා ගැන විස්තර එයාලට කිව්වා අලුත් යාළුවේ කඳුනා ගත්තා කියලා එයාල සතුටු උනා.





ඊට පස්සේ අලි දෙමහල්ලෝ මාව හොඬෙන් අරන් පිටේ තියා ගත්තා වලස් පැංචාත් පිටේ තියා ගත්තා දැන් අපි දෙන්නා අලියාපිටේ තියාගෙන අලි අම්මයි තාත්තයි අලි පැංචයි පේලියට යනව හරියට පෙරහැරක් වගේ අලි පිටේ ඉදන් මම නිකං හිටියේ නෑ. වීර පළු කෝන් වැනි පලතුරු හොඳටම කෑවා. ගෙදර ගෙනියන්නත් මාගේ ළඟ තිබුන මල්ලට දාගත්තා.

අපිට නොදැනීම හොඳටම රෑ වුණා. ආපසු ගෙදර යන්න පාර හොයාගන්නත් අමාරුයි. අනේ මට ගෙදර යන්න ඕනේ. මට හොඳටම ඇඬුනා. ඊට පස්සේ ගෙදර යන්න ක්‍රමයකුත් නැති නිසා අපි රෑය ගත කරන්න තැනක් හෙව්වා. අපිට හොඳට අතු පැතිරුණු ගසක් හමුවුණා. අලි අම්මයි තාත්තයි අපිව ඔසවා ගසෙන් තිබ්බා. මම ගස උඩ නිදා ගත්තා. වලස් පැංචා ගස් පාමුල නිදා ගත්තා අලි පැංචා ගස් යට නිදා ගත්තා.





දඩෝං............. මම ගසෙන් බිමට වැටුණා අලි පැංචයි වලස් පැංචයි මං ගාව හිටියේ නෑ මගේ පුරුදු කාමරේ මම හිටියේ. අලි පැංචයි වලස් පැංචයි නැතුව මට ගොඩක් දුක හිතුනා.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබු භාග්‍යයකි එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි  මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය  මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණීය යුගයේ ස්මාට් බාල පරම්පරාව නුතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි තම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්